JMC JAYASEKERA MANAGEMENT CENTRE
"Pioneers in Professional Education"

# AAT Level 03

## මූල්‍ය වාර්තාකරණය ආදර්ශ ප්‍රශ්න පත්‍රය

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, MBA (PIM-SJP), Visiting Lecturer – Colombo University.

1

# Section A
# (ලකුණු 20)



2

**ප්‍රශ්න අංක 01**

වේගයෙන් වෙනස් වන ලෝකයේ බලපෑමත් සමඟ ගිණුම්කරණය ද වෙනස් වී ඇත ඉතාමත් සංකීර්ණ ලෝකයක අපි ජීවත් වෙමු

අවශ්‍ය වන්නේ

(අ) ගණකාධිකාරීවරුන් මුහුණ දෙන ගිණුම්කරණ ප්‍රවණතා දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 03)

ගිණුම්කරණය සම්බන්ධයෙන් ගත් කල, ආචාරධර්මවලට මුල් තැන දෙන සමාගම් තම පාර්ශවකරුවන් සමඟ විශ්වාසය ගොඩනඟා ගැනීමටත්, මූල්‍ය පාඩු වළක්වා ගැනීමටත්, දිගු කාලීනව සාර්ථක වීමටත් වැඩි ඉඩක් ඇත

අවශ්‍ය වන්නේ

(ආ) ගණකාධිකාරීවරයෙකුට අදාළ ආචාරධර්ම දෙකක් (02) ලැයිස්තුගත කරන්න (ලකුණු 02)

Sandeepa Jayasekera - JMC

3

**ප්‍රශ්න අංක 02**

මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පනාත්මක රාමුවට අනුව, මූලික සහ වැඩිදියුණු කරන ගුණාත්මක ලක්ෂණ ඇත

අවශ්‍ය වන්නේ

සංකල්පනාත්මක රාමුවට අනුව මූලික සහ වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණවල උප සංරචක සඳහන් කරන්න (ලකුණු 02)

Sandeepa Jayasekera - JMC

4

**ප්‍රශ්න අංක 02**

(ආ) ආයුර්වේද්දු (පුද්ගලික) සමාගම 2023 හි සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද අතර එම ආයතනය කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ආයතනයක් ලෙස වර්ගීකරණය කර ඇත. පහත සඳහන් කරුණු පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා සමාගම විසින් මූල්‍ය උපදේශකයෙකු වන පංකජ වෙත යොමු කර ඇත.

(1) සමාගම ශරීරයේ බර අඩු කර ගැනීම සඳහා නව ක්‍රම පිළිබඳව කරන ලද නව පර්යේෂණයක් මත 500,000ක් සහ එම පර්යේෂණ තොරතුරු තුලින් ඔවුන් බන්ඩි මට්ටු නමින් නව සෞඛ්‍යජනක පානයක් සංවර්ධනය කරමින් සිටී. නව සෞඛ්‍යජනක පානය සංවර්ධනය සඳහා ඔවුන් රු. 700,000/-ක් වැය කර ඇත.

(2) සමාගම විසින් රු. මිලියන 10ක ණයක් ගෙන ගොඩනැගිල්ලක් ඉදිකරන ලදි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කාලය තුල ණය ගැනීමේ පිරිවැය රු මිලියන 1 ක් විය.

Sandeepa Jayasekera - JMC

5

(3) සමාගමෙහි සේවකයින් 20 ක් සේවය කරයි. පාරිතෝෂික වගකීම මැනීම සඳහා ආයුගණක විද්‍යාත්මක ක්‍රමය භාවිතා කිරීමට සමාගම සලකා බලයි

අවශ්‍ය වන්නේ,

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මත පදනම්ව ඉහත අවස්ථා සඳහා ගිණුම්කරණ අවශ්‍යතාවය පිළිබඳව උපදෙස් දෙන්න (ලකුණු 03)

Sandeepa Jayasekera - JMC

6

**ප්‍රශ්න අංක 03**

සංකලිත වාර්තාකරණය යනු සංවිධානයක උපාය මාර්ග, පාලනය, කාර්ය සාධනය සහ අපේක්ෂාවන් කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වටිනාකමක් ඇති කිරීමට හේතු වන ආකාරය සන්නිවේදනය කිරීම සඳහා සංකලිත චින්තනය මත පදනම් වූ ක්‍රියාවලියකි

අවශ්‍ය වන්නේ

සංකලිත වාර්තාවේ කොටස් දෙකක් (03) සඳහන් කරන්න (ලකුණු 03)

Sandeepa Jayasekera - JMC

7

**ප්‍රශ්න අංක 03**

තිරසාර වාර්තාකරණය යනු පාරිසරික, සමාජීය සහ පාලන ප්‍රමිතික මෙන්ම මේ මොහොතේ හෝ ඔවුන් අනාගතයේ මුහුණ දිය හැකි අවදානම් සහ බලපෑම් ඇතුළු විවිධ තිරසාර පරාමිතීන් මත ඉලක්ක කරා තම ප්‍රගතිය ප්‍රකාශ කිරීමට සමාගම්වලට හැකි වන මූල්‍ය නොවන වාර්තාකරණ ආකාරයකි

අවශ්‍ය වන්නේ
(ආ) තීරණ ගැනීමේදී තිරසාර වාර්තාකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න (ලකුණු 02)

Sandeepa Jayasekera - JMC

8

JMC vLearning your virtual learning partner

**ප්‍රශ්න අංක 04**

(අ) සමාගමක යන්ත්‍රෝපකරණවල මිල රු. මිලියන 10 ක් වූ අතර 2023 මාර්තු 31 වන දිනට මෙම යන්ත්‍රයේ ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 4 කි. සමාගම විසින් 2023 මාර්තු 31 වන දිනට සාධාරණ වටිනාකම රු මිලියන 3.5 කි. මිලියන 0.2 ක විකුණුම් පිරිවැයක් ඇස්තමේන්තු කර ඇත. යන්ත්‍රයෙන් අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම රු මිලියන 3.8 කි.

අවශ්‍ය වන්නේ
2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණවල හානිකරණ අලාභය ගණනය කරන්න (ලකුණු 02)

Sandeepa Jayasekera - JMC

9

**ප්‍රශ්න අංක 04**

ලොව පුරා මූල්‍ය වෙළෙඳපොළේ මෑතකාලීන වර්ධනයන් සමඟ මූල්‍ය උපකරණ සංකීර්ණ වෙමින් පවතී

අවශ්‍ය වන්නේ
(ආ) මූල්‍ය උපකරණ යන යෙදුම නිර්වචනය කරන්න (ලකුණු 01)
(ඇ) මූල්‍ය වත්කම් සඳහා උදාහරණ දෙකක් (02) ලැයිස්තුගත කරන්න (ලකුණු 02)

Sandeepa Jayasekera - JMC

10

JMC vLearning "your virtual learning partner"

# Section B
# (ළකුණු 30)

Sandeepa Jayasekera - JMC 11

11

Sandeepa Jayasekera - JMC

## ප්‍රශ්න 5

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියෝෂන්ස් (පෞද්ගලික) සමාගමේ** මූලය ප්‍රකාශ උද්ධෘතයන් පහත දැක්වේ

| මාර්තු 31 දිනට Rs.000 | 2023 | 2022 |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට | 4,740 | 4,300 |
| සමුච්චිත ක්ෂයවීම් | (2,060) | (1,410) |
| ධාරණ අගය | 2,680 | 2,890 |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 2,370 | 1,415 |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 4,450 | 2,536 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,280 | 1,320 |
| | 9,100 | 5,271 |
| **මුළු වත්කම්** | 11,780 | 8,161 |

12

12

JMC vLearning
"your virtual learning partner"

| මාර්තු 31 දිනට Rs.000 | 2023 | 2022 |
|---|---|---|
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 2,000 | 2,000 |
| රඳවාගත් ඉපැයීම් | 3,660 | 1,460 |
| | **5,660** | **3,460** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 1,000 | - |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 590 | 500 |
| විලම්භිත බදු වගකීම් | 720 | 500 |
| | **2,310** | **1,000** |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 2,760 | 2,851 |
| ගෙවිය යුතු ආදායම් බදු | 1,050 | 850 |
| | **3,810** | **3,701** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **11,780** | **8,161** |

Sandeepa Jayasekera - JMC

13

Sandeepa Jayasekera - JMC

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතය

| | රු.'000 |
|---|---|
| පොලී සහ ආදායම් බදු පෙර ලාභය | 2,900 |
| පොලී වියදම් | (250) |
| **ආදායම් බදු පෙර ලාභය** | **2,650** |
| ආදායම් බදු | (450) |
| **වර්ෂයට අදාල ලාභය** | **2,200** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) වර්ෂයට අදාල ආදායම් බදු තුළ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල විලම්භිත බදු වියදම අන්තර්ගත වේ.

14

14

Sandeepa Jayasekera - JMC

(2) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල සමාගම විසින් රු. 550,000/- ක් පිරිවැය වූ උපකරණයක් රු. 400,000/- ක මුදලකට ඉවත් කරන ලදි. ඉවත් කරන ලද දිනට උපකරණයේ ධාරණ අගය රු. 200,000/- ක් විය.

(3) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් කිසිදු විස්තීර්ණ ආදායමක් නොතිබුණි. තවද, වර්ෂය අවසන් දිනට උපචිත පොලී වියදම් කිසිවක් නොතිබුණි.

(4) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල පාරිතෝෂිත ගෙවීම් පාරිතෝෂික ගෙවීම් රු 50,000ක් විය.

**සීමාසහිත සියැස්ටෝ ක්‍රියේෂන්ස් (පෞද්ගලික) සමාගමේ** 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

15

15

**ප්‍රශ්න අංක 06**

(අ) නිමල් ජෙනරේටර්ස් විසින් 2023 මාර්තු 25 වන දින සමන් වෙත රු මිලියන 3ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් අලෙවි කරන ලදි. සමන් එදිනම මුළු මුදලම ලබා දෙන ලදි. ජෙනරේටරය 2023 මාර්තු 30 වැනි දින සමන්ගේ ආයතනයට ගෙන එන ලදි. එය ස්ථාපන කිරීම අවසන් වූයේ 2023 අප්‍රේල් 01 වැනිදාය. 2023 අප්‍රේල් 3 වැනිදා සිට සමන් විසින් ජෙනරේටරය භාවිත කිරීම ආරම්භ කරන ලදි. නිමල් ජෙනරේටර්ස් විසින් මාර්තු 30 වැනි දින සිට අඛණ්ඩව දින 5ක් සඳහා කමල් වෙත ජෙනරේටරයක් කුලියට දි ඇත. දිනකට ගාස්තුව රු 20,000 කි. කමල් විසින් රු. 100,000 නිමල් වෙත ලබා දි තිබේ. එයින් 50% අත්තිකාරම් ගෙවීමක් වන අතර ඉතිරිය ආපසු ගෙවන තැන්පතුවකි.

**අවශ්‍ය වන්නේ**

අයභාරය ප්‍රමිතය භාවිතා කරමින් නිමල් ජෙනරේටර්ස්හි 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් සටහන් දක්වන්න (ලකුණු 05)

Sandeepa Jayasekera - JMC

16

**ප්‍රශ්න අංක 06**

(ආ) සීමාසහිත කේසර සමාගම විසින් සම්පත් ලීසිං වෙතින් කල්බදු පදනමක් යටතේ යන්ත්‍රයක් ලබාගන්නා ලදි. 2022.04.01 දින මූලික ගෙවීමක් ලෙස රු 200,000/-ක් ගෙවන ලදි. ඉතිරිය රු 400,000/- බැගින් වන වාරික 03 කින් ගෙවීමට එකඟ විය. පොළී අනුපාතය 10%කි.

වට්ටම් සාධක පහත පරිදි වේ

01 වසර 0.91

02 වසර 0.83

03 වසර 0.76





යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 2ක් වේ. ගිවිසුම අවසානයේ යන්ත්‍රයේ අයිතිය මාරු නොවේ. සමාගම විසින් යන්ත්‍රය සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරයි. 2023.03.31 දිනට යන්ත්‍රය ප්‍රත්‍යාගණන කරන ලද අතර ප්‍රත්‍යාගණන වටිනාකම රු.800,000/-ක් විය.

**අවශ්‍ය වන්නේ**

ඔබ විසින් ඉහත ගනුදෙනුව 2023/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය තුල සහ 2022/23 වර්ෂයේ ලාභාලාභ ගිණුම තුල නිරූපණය කළ යුතු ආකාරය දක්වන්න

## ප්‍රශ්න අංක 07

2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත X සමාගමේ ගිණුම්** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි

(1)

| අයිතමය | ගිණුම්කරණ ධාරණ අගය (ලියාහල අගය) (රු.) | බදු පදනම (රු.) |
|---|---|---|
| ගොඩනැගිලි | 6,000,000 | 5,000,000 |
| වාහන | 2,500,000 | 2,000,000 |



(2) 2022 අප්‍රේල් 01 දිනට විලම්භිත බදු වත්කම්/වගකීම් ගිණුමේ ශේෂයක් නොවීය.

(3) 2023 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා වෙන්කිරීම රු. 700,000/-

(4) **සීමාසහිත X සමාගමට** අදාල බදු ප්‍රතිශතය 28% කි

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023 මාර්තු 31 දිනට තාවකාලික වෙනස්කම් (temporary differences) **හඳුනාගන්න.** (ලකුණු 03)

2023 මාර්තු 31 දිනට විලම්භිත බදු වත්කම/වගකීම **ගණනය කරන්න.** (ලකුණු 02)



JMC vLearning "your virtual learning partner"

**ප්‍රශ්න අංක 07**

ශෂිනි සමාගම තම ව්‍යාපාරය තුල ඇති පොදු අරමුදල් යොදාගෙන ප්‍රදර්ශනාගාරයක් ඉදි කිරීමට සැළසුම් කරයි. ව්‍යාපාරය සතුව ඇති පොදු අරමුදල් පහත පරිදි වේ

| බැංකුව | ණය රු. මිලියන | පොලී අනුපාතය |
|---|---|---|
| Commercial Bank | 40 Mn | 10% |
| Bank of Ceylon | 20 Mn | 9% |
| Hatton National Bank | 15 Mn | 12% |
| HSBC | 25 Mn | 15% |





2022/04/01 දින ආරම්භ වූ සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 50 ක් වැය වේ. රජය විසින් පැන වූ ආනයන සීමාවන් නිසා අමුද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදයක් ඇති වූ අතර මේ හේතුවෙන් 2022/05/15 සිට දින 15 ක් ඉදිකිරීම තාවකාලිකව නවතා දමන ලදී. ප්‍රදර්ශනාගාරය 2022/12/31 දින වන විට අවසන් වූ අතර 2023/02/01 දින සිට භාවිතය ආරම්භ කරන ලදී. ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය 3/31 න් අවසන් වේ. මෙම කාලය තුල රු. මිලියන 1 ක ආයෝජන ආදායමක් උපයා ගන්නා ලදී

**අවශ්‍ය වන්නේ**

2023 මාර්තු 31 වැනි දිනට ප්‍රදර්ශනාගාරය යටතේ ප්‍රාග්ධනීකරණය කළ යුතු ණය ගැනීමේ පිරිවැය ගණනය කරන්න (ලකුණු 05)

# Section C
# (ලකුණු 50)





## ප්‍රශ්න අංක 08

**සීමාසහිත ශෙවාන් පොදු සමාගම**, කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත සමාගමකි. 2023 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය - කොටස් 2,000,000 | | 40,000 |
| 2022 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 2,500 |
| **දේපළ, පිරියත සහ උපකරණ (පිරිවැයට):** | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම - රු.මිලියන 20) | 30,000 | |
| මෝටර් වාහන | 10,000 | |
| කාර්යාල උපකරණ | 3,500 | |
| **2022 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 6,000 |
| මෝටර් වාහන | | 2,000 |
| කාර්යාල උපකරණ | | 950 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 600 | |
| 2023 මාර්තු 31 දිනට තොගය (පිරිවැයට) | 25,000 | |







JMC vLearning your virtual learning partner

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු මුදල්/වෙළඳ ගෙවිය යුතු මුදල් | 62,000 | 45,000 |
| 2022 අප්‍රේල් 01 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 700 |
| උපචිත වියදම් | | 1,000 |
| 2021/22 තක්සේරු වර්ෂයට අදාලව ගෙවිය යුතු ආදායම් බදු | | 1,200 |
| බැංකු ණය | | 3,000 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 200 | |
| බැංකු අයිරාව | | 300 |
| විකුණුම් පිරිවැය/විකුණුම් | 174,500 | 262,500 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 1,000 | |
| පරිපාලන වියදම් | 20,200 | |
| බෙදාහැරීමේ වියදම් | 26,500 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 1,850 | |
| මූල්‍ය වියදම් | 3,800 | |
| ගෙවූ ආදායම් බදු | 6,000 | |
| | **365,150** | **365,150** |





පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) ගනුදෙනුකරුවෙකුට භාණ්ඩ බෙදාහරින අතරතුර 2022 ජුනි 30 දින අනතුරකට ලක්වූ බෙදාහැරීමේ ලොරි රථයක්, 2022 ඔක්තොම්බර් 31 දින සමාගම විසින් රු. 200,000/- ක මුදලකට ඉවත් කරන ලදී. ලොරි රථය රු. මිලියන 1.2 ක මුදලකට මිලදීගෙන තිබුණු අතර, 2022 අප්‍රේල් 01 දිනට එහි සමුච්චිත ක්ෂය රු. 600,000/- ක් විය. සිදු වූ හානිය වෙනුවෙන් ලොරි රථයේ ගැනුම් මිලෙන් 1/4 කට සමාන ප්‍රමාණයක් සමාගමට රක්ෂණ වන්දිය වශයෙන් හිමි විය. ලැබූ රක්ෂණ වන්දිය සහ ලොරි රථය ඉවත් කිරීමෙන් ලද මුදල යන දෙකම විකුණුම් ගිණුමට බැර කර ඇත. මේ හැර ලොරි රථය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොතිබුණි.

(2) 2022 ජුනි 01 දින, රු. මිලියන 1.5 ක් වටිනා නව පරිගණක මෘදුකාංගයක් සමාගම විසින් මිලට ගන්නා ලදී. අදාල මෘදුකාංගය සමාගමේ ව්‍යාපාරික කටයුතුවලට අදාල වන පරිදි සංවර්ධනය කිරීම සඳහා එදිනම රු. 300,000/- ක අමතර වියදමක් ද සමාගම විසින් දරණ ලදී. පරිගණක මෘදුකාංගයේ ගැනුම් මිල සහ සංවර්ධනය කිරීමේ පිරිවැය යන දෙකම ගැනුම් ගිණුමේ වාර්තා කර තිබුණි.

(3) 2022 ඔක්තොම්බර් 01 දින ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සමාගම විසින් රු. 3,000,000/- ක ණයක් ලබාගත් අතර, එදිනම ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ වැඩකටයුතු ආරම්භ කරන ලදී 2023 මාර්තු 31 දිනට ගොඩනැගිල්ල ඉදිකිරීමට රු. 600,000/- ක පිරිවැයක් දරා තිබූ අතර, එය ප්‍රාග්ධන නොනිමි වැඩ ලෙස වර්ගීකරණය කර තිබුණි. ණය මුදලට අදාල වාර්ෂික පොලී අනුපාතය 12% කි. වර්ෂය තුලදී මෙම ණය මුදලට අදාලව නැවත ගෙවීම් කිසිවක් සිදුකර නොමැති අතර, ණය මුදල මත ප්‍රවර්තන වර්ෂයට අදාල පොලිය, මූල්‍ය වියදම්වලට හර කර උපචිත වියදම්වලට බැර කර තිබුණි.

(4) දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීව කාලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 20 |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |
| කාර්යාල උපකරණ | : | වර්ෂ 05 |
| පරිගණක මෘදුකාංග | : | වර්ෂ 03 |

(5) 2023 මාර්තු 31 දිනට පැවති තොගයෙන් රු. 500,000/- ක් පිරිවැය වූ තොග යල්පැන ඇතැයි අනාවරණය නවූ අතර, එය 2023 අප්‍රේල් 30 දින රු. 100,000/- ක මුදලකට විකුණන ලදී.

(6) 2023 මාර්තු 31 දිනට සමාගමට රු. 2,000,000/- ක මුදලක් අයවිය යුතුව තිබූ ණයගැතියෙක් 2023 මැයි 05 දින බංකොළොත්භාවයට පත් විය. එමනිසා ඔහුගෙන් අයවිය යුතුව තිබූ සම්පූර්ණ මුදලම නැවත අයකරගත නොහැකි තත්ත්වයට පත් විය. තවද, 2023 මාර්තු 31 දිනට ඉතිරි වෙළඳ ලැබිය යුතු මුදල් වෙනුවෙන් 5% ක පොදු වෙන්කිරීමක් ද සිදු කළ යුතුව ඇත.

(7) 2022/23 වර්ෂය තුළදී සමාගමේ ගනුදෙනුකරුවෙක් සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. මේ සඳහා වූ නඩුවේ තීන්දුව 2023 මැයි 05 දින ලබා දී ඇති අතර, ඒ අනුව රු. 260,000/- ක වන්දියක් එම ගනුදෙනුකරුට ගෙවීමට සමාගමට සිදු විය.



(8) 2023 අප්‍රේල් මාසයට අදාල රක්ෂණ ගෙවීම වූ රු. 110,000/-, රක්ෂණ වියදම තුළ ඇතුලත් කර ඇති අතර, එය පරිපාලන වියදම් යටතේ වාර්තාකර තිබුණි.

(9) 2022/23 තක්සේරු වර්ෂයට අදාල සමාගමේ ආදායම් බදු වගකීම රු. 6,500,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(10) 2023 අප්‍රේල් 30 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී 2023 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු. 1/- ක අවසාන ලාභාංශයක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කර ඇත.

(11) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 මැයි 30 දින, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.



JMC vLearning your virtual learning partner

**ඔබ විසින් කළ යුතු දෑ:**
ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ශෙවාන් පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න.**

(a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය) (ලකුණු 10)
(b) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 07)
(c) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 03)
(d) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 05)
(මුළු ලකුණු 25)

Sandeepa Jayasekera - JMC 29

29

# ප්‍රශ්න අංක 09

**සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගමේ** පොත්වලින් 2022/23 සහ 2021/22 වර්ෂ සඳහා පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන උපුටාගෙන ඇත.

සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගම
2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

Sandeepa Jayasekera - JMC 30

30

| | රු. '000 |
|---|---|
| විකුණුම් | 378,500 |
| විකුණුම් පිරිවැය | (265,900) |
| දළ ලාභය | 112,600 |
| වෙනත් ආදායම් | 14,650 |
| | 127,250 |
| වියදම්: | |
| බෙදාහැරීමේ වියදම් | (24,780) |
| පරිපාලන වියදම් | (49,540) |
| මූල්‍ය වියදම් - ණය පොලී | (8,200) |
| බදු පෙර ලාභය | 44,730 |
| ආදායම් බදු | (950) |
| වර්ෂය සඳහා ලාභය | 43,780 |





**සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන**

| | 2023 මාර්තු 31 දිනට | | 2022 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| වත්කම්: | | | | |
| ජංගම නොවන වත්කම්: | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ, ධාරණ අගයට | | 169,800 | | 100,500 |
| ජංගම වත්කම්: | | | | |
| තොගය | 29,000 | | 32,500 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 39,000 | | 38,200 | |
| වෙනත් ලැබිය යුතු මුදල් | 2,500 | | 3,000 | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 4,200 | 74,700 | 18,500 | 92,200 |
| මුළු වත්කම් | | 244,500 | | 192,700 |





JMC vLearning "your virtual learning partner"

**සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන**

| | 2023 මාර්තු 31 දිනට | | 2022 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| ස්කන්ධය: | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 90,000 | | 90,000 | |
| රඳවාගත් ඉපැයීම් | 78,000 | 168,000 | 39,500 | 129,500 |
| ජංගම නොවන වගකීම්: | | | | |
| දිගු කාලීන ණය | 18,000 | | 12,000 | |
| සේවක ප්‍රතිලාභ | 16,500 | 34,500 | 20,500 | 32,500 |
| ජංගම වගකීම්: | | | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 34,000 | | 29,600 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 500 | | 400 | |
| උපචිත වියදම් | 7,500 | 42,000 | 700 | 30,700 |
| මුළු ස්කන්ධය සහ වගකීම් | | 244,500 | | 192,700 |





2022/23 වර්ෂය සඳහා සඳහන් කර්මාන්තයේ සාමාන්‍යයෙන් ද (industry average) හඳුනාගෙන ඇත.

| | |
|---|---|
| දළ ලාභය අනුපාතය | 35% |
| ශුද්ධ ලාභ අනුපාතය | 12% |
| ජංගම අනුපාතය | 2.5 : 1 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 45 |
| තොග නේවාසික කාලය | දින 40 |
| පොලී ආවරණ අනුපාතය | වාර 5 |

සියළුම විකුණුම් ණය පදනම මත සිදු කරන බව උපකල්පනය කරන්න.





JMC vLearning "your virtual learning partner"

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2023 මාර්තු 31 දිනට / දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් අනුපාත **ගණනය කරන්න.**

- දළ ලාභ අනුපාතය
- ශුද්ධ ලාභ අනුපාතය
- ජංගම අනුපාතය
- ණයගැති එකතුකිරීමේ කාලය
- තොග නේවාසික කාලය
- පොලී ආවරණ අනුපාතය (ලකුණු 06)

(b) ඉහත හඳුනාගන්නා ලද කර්මාන්තයේ සාමාන්‍යයෙන් සැළකිල්ලට ගනිමින්, **සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගමේ** 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා/අවසන් දිනට කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 12)

Sandeepa Jayasekera - JMC 35

35

# ප්‍රශ්න 10

2023 මාර්තු 31 දිනට **සීමාසහිත පැරිස් පොදු සමාගමේ** සහ **සීමාසහිත සිඩ්නි (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන උපුටාගෙන ඇත.

| රු. 000 | **පැරිස්** | **සිඩ්නි** |
|---|---|---|
| ජංගම නොවන වත්කම්: | | |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 55,000 | 15,000 |
| සමුච්චිත ක්ෂය | (12,000) | (6,000) |
| ධාරණ අගය | 43,000 | 9,000 |
| සිඩ්නිහි ආයෝජනය | 20,000 | - |
| ජංගම වත්කම්: | | |
| තොග | 20,100 | 20,500 |
| සිඩ්නි වෙත ලබා දී ඇති කෙටිකාලීන ණය | 5,500 | - |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 39,750 | 10,500 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 6,500 | 4,600 |
| මුළු වත්කම් | 134,850 | 44,600 |

36

36

| රු. 000 | පැරිස් | සිඩ්නි |
|---|---|---|
| ස්කන්ධය: | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 82,000 | 20,000 |
| රඳවාගත් ඉපැයීම් | 15,750 | 6,700 |
| ජංගම නොවන වගකීම්: | | |
| බැංකු ණය | 10,200 | - |
| ජංගම වගකීම්: | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | 13,100 | 7,000 |
| ගෙවිය යුතු ලාභාංශ | - | 1,000 |
| බැංකු ණය | 5,200 | - |
| පැරිස් මඟින් ලබාගත් කෙටි කාලීන ණය | - | 5,000 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | 8,600 | 4,900 |
| මුළු ස්කන්ධය සහ වගකීම් | 134,850 | 44,600 |

37

37

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) පැරිස් සමාගම, සිඩ්නි සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් 2022 අප්‍රේල් 01 දින රු. මිලියන 25 ක ප්‍රතිශ්ඨාවකට අත්පත් කරගෙන ඇත. මුදල් ප්‍රතිශ්ඨාව ලෙස රු මිලියන 20ක් ගෙවන ලදි. පැරිස් සමාගම විසින් රු මිලියන 5ක කොටස් සිඩ්නි සමාගමේ පෙර අයිතිකරුවන් වෙත නිකුත් කර තිබුණි. මෙම කොටස් නිකුතුව ගිණුම්ගත කර නොතිබුණි.

(2) අත්පත් කරගන්නා ලද දිනට පාලනය නොවන හිමිකමේ සාධාරණ අගය රු. මිලියන 5 ක් විය. අත්පත් කරගන්නා ලද දිනට, රඳවාගත් ලාභය, රු. මිලියන 2 ක් වූ අතර, අත්පත් කරගන්නා ලද දිනට සිඩ්නි සමාගමේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය ඒවායේ පොත් අගයට වඩා රු. මිලියන 1ක් වැඩි විය. මෙය යන්ත්‍රයකට අදාළ වූ අතර එම යන්ත්‍රයේ ඉතිරි ඵලදායී ජීව කාලය වර්ෂ 4ක් විය.

(3) 2023 මාර්තු 31 දිනට, සිඩ්නි සමාගමෙහි පැවති තොගයෙහි පැරිස් සමාගමෙන් මිලට ගත් රු මිලියන 3 ක වටිනාකමක් සහිත තොග නොවිකිණී ඉතිරිව පැවතිණි. පැරිස් සමාගම විසින් සිඩ්නි සමාගමට විකුණුම් මිලෙන් 20% ක ලාභාන්තිකයක් සහිතව භාණ්ඩ විකුණා තිබුණි.

38

38

(4) සිඩ්නි සමාගම, 2022 අප්‍රේල් 01 පැරිස් සමාගමෙන් රු. මිලියන 5.5 ක ණය මුදලක් ලබා ගන්නා ලදි. 2023 මාර්තු 31 දින සිඩ්නි සමාගම රු. 500,000ක මුදලක චෙක්පතකින් ගෙවා ඇත. එහෙත් තවමත් එම මුදල පැරිස් සමාගමට ලැබී නොමැත.

(5) සිඩ්නි සමාගම විසින් 2022 ඔක්තෝබර් 01 දින පොත් අගය රු. මිලියන 2ක් වූ යන්ත්‍රයක් පැරිස් සමාගමට රු. මිලියන 3කට අලෙවි කරන ලදි. එදිනට එම යන්ත්‍රයේ ඉතිරි ඵලදායී ජීව කාලය වසර 2ක් විය.

(6) සිඩ්නි සමාගම විසින් රු. මිලියන 1ක අතුරු ලාභාංශයක් ප්‍රකාශ කර ඇති අතර, පැරිස් සමාගම තවමත් ලැබිය යුතු ලාභාංශ ගිණුම් ගත කර නොමැත.

(7) 2023 මාර්තු 31 දිනට සිඩ්නි සමාගම අත්පත් කරගැනීම මත ඇති වූ කීර්තිනාමය 20%කින් හානිකරණය වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කීර්තිනාමය **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) 2023 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 10)

39

39

JMC vLearning "your virtual learning partner"